# සබරගමුව පළාත් සභාව

## 1989 අංක 06 දරන

## පළාත් සභා ප්‍රඥප්තිය

**ප්‍රඥප්ති නාමය:-** සබරගමුව පළාත් සභාව (පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය.)

**සභා සම්මත කළ දිනය:-** 1989 දෙසැම්බර් මස 29 වන දින.

**ගරු ආණ්ඩුකාර තුමා අනුමත කළ දිනය.** } 1990 ජනවාරි මස 17 වන දින.

මුල් පිටපත සමග සැසඳුවෙමි,
සත්‍ය පිටපතකි.
4/8/4
ලේකම්, සහකාර ලේකම්, මුදල් සහකාර
ප්‍රධාන කළමනාකරණ සහකාර

සබරගමුව පළාත් සභාව

(පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ)

1989 අංක: 06 දරණ ප්‍රඥප්තියයි.

---

සබරගමුව පළාත තුළ ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම පිණිස සහ ඊට අනුෂංගික කරුණු ක්‍රියාත්මක කිරීමට අදාල විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ සබරගමු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. ප්‍රඥප්ති 1989 අංක. 06 දරණ සබරගමු පළාත් සභාවේ (පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, පළාතේ ආණ්ඩුකාරවරයා-ගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

02. (1) කවර අවස්ථාවකදී වුවද ---

(අ) යම් පළාත් පාලන ආයතනයක අදක්ෂතාව සහ නොමනා පාලනය; හෝ

(ආ) කවර නීතියක් මගින් නියමවී ඇති කාර්යය ඉටු කිරීම නිරතුරුවම පැහැර හැර තිබීම ; හෝ

(ඇ) නීතියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම, නිරතුරුවම ප්‍රතික්ෂේප කර තිබීම හෝ නොසලකා හැර තිබීම ; හෝ

(ඈ) කිසියම් පළාත් පාලන ආයතනයක ආඥාපනත මගින් නැතහොත් කවර නීතියක් මගින් පිරිනමා ඇති බලතල කිසිවක් සභාපතිවරයා විසින් හෝ එම පළාත් පාලන ආයතනයේ යම් මන්ත්‍රීවරයෙකු විසින් හෝ අනිසි ලෙස යොදවා තිබීම; හෝ

(ඉ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම් වලට පැමිණ සිටීම හෝ පවත්වන ලද රැස්වීමකදී ඡන්දය පාවිච්චි කිරීම හෝ රැස්වීමේ කටයුතු කිරීම හෝ සභාපතිවරයා විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු විසින් හෝ නිරතුරුවම ප්‍රතික්ෂේප කර තිබීම, පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වුවහොත්, ඒ එක් එක් අවස්ථාවට අනුව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ----

අදක්ෂතාව ආදිය නිසා සභාව විසුරුවා හැරීමට අමාත්‍යවරයාට ඇති බලය.

I. එම පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා ධුරයෙන් පහකළ හැකිය; නැතහොත්

II. එම පළාත් පාලන ආයතනයේ සියළුම මන්ත්‍රීවරුන් හෝ ඔවුනතුරින් යම් මන්ත්‍රීවරයෙකු හෝ ධුරයෙන් පහකළ හැකිය; එසේ නැතහොත්

III. එම පළාත් පාලන ආයතනය විසුරුවා හැරිය හැකිය;

තවද ඒ නියමය හැකි පහසු ඉක්මණින් පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උප වගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර (1) වන (අ) වගන්තියේ සඳහන් යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමකට පත්වීම් වස්, ඒ කාරණය ගැන මාස තුනක් වූ කාල සීමාවක් ඇතුළත පරීක්‍ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිළදරයෙකු පත් කළ යුතුය. එසේ පත් කරන නිළධරයාට, ඒ පරීක්‍ෂණයට අදාලව පරීක්‍ෂණ කොමිසන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්‍ෂණ කොමිෂමක බලතල ඇත්තේය.

(3) (අ) යම් කාරණයක් ගැන පරීක්‍ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විශ්‍රාමලත් අධිකරණ නිළධරයෙකු (2) වන උප වගන්තිය යටතේ පත් කරන ලද විටක, අවස්ථාවට අනුව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් —

(I) සභාපතිවරයාගේ ධුරය තාවකාලිකව නතර කොට, සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, සභාපති-වරයාගේ කාර්ය ඉටු කිරීමටත් උප සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාගේ ධුරය තාවකාලිකව නතරකොට ඇති අවස්ථාවක, නාගරික කොමසාරිස්වරයාට හෝ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට කළ හැකිය; නැතහොත්

(II) යම් මන්ත්‍රීවරයෙකුගේ ධුරය තාවකාලිකව නතර කළ හැකිය; එසේ නැතහොත්

(III) යම් පළාත් පාලන ආයතනයක් තාවකාලිකව නතරකොට එම පළාත් පාලන ආයතනයේ සහ සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, ඔහුගේ කාර්ය ඉටු කිරීමටත් අවස්ථාවෝචිත පරිදි නාගරික කොමසාරිස්වරයාට හෝ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට විධාන කළ හැකිය.

...

(ආ) එසේ (2) වන උප වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයාගේ චාර්තාව ලැබුණු පසු, අමාත්‍යවරයා විසින් (3) වන උප වගන්තිය යටතේ නියමයක් කළ හැකිය. නැතහොත් මේ වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ කළ නියමය අවලංගු කළ හැකිය.

(ඇ) අමාත්‍යවරයා විසින් (2) වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් පළාත් පාලන ආයතනයක සභාපතිවරයා ධුරයෙන් පහ කරනු ලැබූ විටක, ඒ සභාපතිවරයාගේ මන්ත්‍රී ධුරයද අවසන් වන අතර, එසේ ඇති වන පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන අදාල වන්නේය.

(4) (අ) එවැනිම ආකාරයෙන් පළ කරනු ලබන යම් තදනන්තර නියමයක් මගින් අවස්ථාවෝචිතව මහ නගර සභා ආඥා පනතින් හෝ නගර සභා ආඥා පනතින් හෝ ප්‍රාදේශීය සභා පනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් පළාත් පාලන ආයතනය හෝ සභාපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ සතු කරනු ලැබුවා වූද එකී නියමයෙහි හෝ එම නියමය සංශෝධනය කරන වෙනයම් නියමයක හෝ නියමවල දැක්වෙන්නාවූ අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල කාර්ය හා කටයුතු සතුව සිටීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, ඉටු කිරීමට සහ කිරීමටත් විශේෂ කොමසාරිස්වරයෙකු හෝ විශේෂ කොමසාරිස්වරුන් ප්‍රකාශිත කාල සීමාවකට හෝ කලින් කල ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය; නැතහොත්

(ආ) විසුරුවා හරින ලද පළාත් පාලන ආයතනය වෙනුවට මහ නගර සභා ආඥා පනතේ හෝ නගර සභා ආඥා පනතේ හෝ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන වලට අනුකූලව අළුත් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කළ යුතු යැයි අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය.

(5) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයකම එම නියමය බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වියහැකි විධාන ඇතුළත් වියයුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට එය ට නීතියේ බලය ඇති විය යුතුය.

(6) පලාත් පාලන ආයතනය විසුරුවා හැරීමෙන් පසු විසුරුවා හරින ලද පලාත් පාලන ආයතනය වෙනුවට අළුත් පලාත් පාලන ආයතනයක් පිහිටුවිය යුතුය. එවැනි අළුත් පලාත් පාලන ආයතනයක්, එම පලාත් පාලන ආයතනය පිහිටුවීමට පූර්වාසන්නයේ වූ පලාත් පාලන ආයතනය සම්බන්ධයෙන් අදාල මහ නගර සභා ආඥා පනත හෝ නගර සභා ආඥා පනත හෝ ප්‍රාදේශීය සභා පනත මගින් අවස්ථාවෝචිතව, පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ සතු කරනු ලැබුවාවූ ද අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය හා කටයුතු සතුව සිටීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, ඉටු කිරීමට සහ කිරීමටත්, යෙදවූ පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයින්ගේ අනුප්‍රාප්තිකයෙකු හෝ අනුප්‍රාප්තිකයන් වන්නේය.

(7) පලාත් පාලන ආයතනය විසුරුවා හැරීමෙන් පසු සහ (4) වන උප වගන්තිය යටතේ විශේෂ කොමසාරිස්වරයෙකු හෝ විශේෂ කොමසාරිස්වරුන් පත් කිරීමෙන් පසු කවර විටකදී වුවද, විසුරුවා හරින ලද පලාත් පාලන ආයතනය වෙනුවට මහ නගර සභා ආඥා පනතේ හෝ නගර සභා ආඥා පනතේ හෝ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට අනුකූලව එම පලාත් පාලන ආයතන සීමාව තුළ අළුත් පලාත් පාලන ආයතනයක් සංස්ථාපනය කළ යුතු යැයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය.

(8) මේ වගන්තිය මගින් පිරි නමන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, පලාත් පාලන ආයතනය විසුරුවා හැරීමේ සිට විශේෂ කොමසාරිස්වරයෙකු නොහොත් විශේෂ කොමසාරිස් වරුන් පත්කිරීම හෝ අළුත් පලාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීම දක්වා හෝ පත් කරන ලද විශේෂ කොමසාරිස්වරයා හෝ විශේෂ කොමසාරිස්වරයන් ධූරය දැරීම අවසන් වීමේ සිට අළුත් පලාත් පාලන ආයතනයක් සංස්ථාපනයක් කිරීම දක්වා යම් කාලයක් ගතවීම අවශ්‍යවන කවර අවස්ථාවකදී වුවද, ඒ කාලය තුළදී ---

(අ) මහ නගර සභා ආඥා පනතින් හෝ නගර සභා ආඥා පනතින් හෝ ප්‍රාදේශීය සභා පනතින් හෝ වෙනයම් ලිඛිත නීතියකින් පලාත් පාලන ආයතනය, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වෙත පැවරුණු හෝ පිරිනැමුණු හෝ නියම කෙරුණු සියලුම අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය නාගරික කොමසාරිස්වරයා හෝ පලාත් පාලන සහකාර කොමසාරිස්වරයා සතුවිය යුතු අතර, ඔහු විසින් ඒවා ක්‍රියාවේ යෙදවීමද ඉටු කිරීමද සිදු කිරීමද කළ යුතුය; තවද

(ආ) නාගරික කොමසාරිස්වරයා හෝ පලාත් පාලන සහකාර කොමසාරිස්වරයා අවස්ථාවෝචිත පරිදි, විසුරුවා හරිනු ලැබූ පලාත් පාලන ආයතනයේ හෝ විශේෂ කොමසාරිස් වරයාගේ හෝ විශේෂ කොමසාරිස්වරයන්ගේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

(9) පලාත් පාලන ආයතනයේ විසුරුවා හරිනු ලැබූ විට (4) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා හෝ විශේෂ කොමසාරිස්වරයන් ---

(අ) පත් කිරීම කරනු ලැබුවේ පලාත් පාලන පාලන ආයතනය විසුරුවා හැරීමෙන් ඉක්බිතිව නම්, විසුරුවා හරිනු ලැබූ පලාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් විය යුතුය; තවද

(ආ) පත් කිරීම කරනු ලැබුවේ (8) වන උප වගන්තියෙහි සඳහන් අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ තර්තව්‍ය ඒ උප වගන්තිය යටතේ නාගරික කොමසාරිස්වරයා හෝ පලාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් ක්‍රියාවේ යෙදවීමෙන්, ඉටු කිරීමෙන් සහ සිදු කිරීමෙන් පසුව නම්, නාගරික කොමසාරිස්වරයාගේ හෝ පලාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් විය යුතුය.

03. යම් පලාත් පාලන ආයතනයක හෝ ඒ පලාත් පාලන ආයතනයේ යම් ස්ථාවර හෝ විශේෂ කමිටුවක යම් වාර්තාවක යම් උද්ධෘතයක් තමාට සපයන ලෙස අමාත්‍ය වරයා විසින් ලිඛිත නියමයක් මගින් ඒ පලාත් පාලන ආයතනයට නියම කළහැකි අතර, ඒ පලාත් පාලන ආයතනය අයුක්ති සහගත ප්‍රමාදයකින් තොරව ඒ නියමයට අනුකූලව ක්‍රියා කළ යුතුය. වාර්තා උද්ධෘත ඉල්ලීමට අමාත්‍යවරයාට ඇති බලය.

04. යම් පලාත් පාලන ආයතනයක ක්‍රියා කාරිත්වය, ආදායම සහ වියදම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් සුදුසුයැයි සලකනු ලබන සංඛ්‍යා ලේඛන ඔහු විසින් ඉල්විය හැකි අතර, ඒ පලාත් පාලන ආයතනය අයුක්ති සහගත ප්‍රමාදයකින් තොරව ඒ නියමයට අනුකූලව ක්‍රියා කළ යුතුය. සංඛ්‍යා ලේඛන ඉල්ලීමට අමාත්‍යවරයාට ඇති බලය.

......./6.

05. යම් මහ නගර සභා ආඥා පනතකින් හෝ නගර සභා ආඥා පනතකින් හෝ ප්‍රාදේශීය සභා පනතකින් හෝ යම් වෙනත් ලිඛිත නීතියකින් යම් පළාත් පාලන ආයතනයක් වෙත පවරන ලද යම් කාර්යයක් හෝ වැඩක් එම පළාත් පාලන ආයතනය විසින් නොකරනු ලබන බව යම් අවස්ථාවක අමාත්‍යවරයාට පෙනී ගියහොත්, ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වීමට හේතු ඇති බව පළාත් පාලන ආයතනය විසින් දවස් පහළොවක් ඇතුළත පෙන්වනු ලැබුවහොත් මිස, ඒ කරුණෙහි සිද්ධි පරීක්ෂා කොට ඔහු වෙත වාර්තා කිරීමට විශේෂ නිලධරයෙකු පත් කරන බවත් ඒ කාර්යය ඉටු කිරීමේ හෝ වැඩය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඒ නිලධරයා විසින් සිතනු ලබන පියවර නිර්දේශ කිරීමට ඒ නිලධරයාට නියම කරන බවත් අමාත්‍යවරයා විසින් දැන්වීමක් මගින් පළාත් පාලන ආයතනය වෙත දන්වනු ලැබිය හැකිය. ඒ පරීක්ෂණය, හැකිතාක් දුරට, විවෘතාකාරයෙන් පැවැත්විය යුතුය. *පරීක්ෂණ පැවැත්වීමට අමාත්‍යවරයාට ඇති බලය.*

06. 5 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයාගේ වාර්තාව ලැබුණු විට, ඉටු කළ යුතු හෝ ක්‍රියාත්මක කළයුතු කාර්යය හෝ වැඩය කුමක්දැයි අමාත්‍යවරයා විසින් නිශ්චය කළහැකි අතර, ඒ කාර්යය හෝ වැඩය එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත ඉටු කළ යුතු යැයි හෝ ක්‍රියාත්මක කළ යුතු යැයි අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනයට නියම කළ හැකිය. *අවශ්‍ය වැඩ කළ යුතු බව ප.පා.අ. නියම කිරීමට අමාත්‍යවරයා ඇති බලය.*

07. (1) 6 වන වගන්තියෙහි සඳහන් යම් කාර්යයක් ඉටු කිරීමේ හෝ යම් වැඩක් කරගෙන යෑමේ කාර්යය සඳහා, පහත සඳහන් ක්‍රම අතුරින් යම් එක් ක්‍රමයකින් හෝ රට වැඩි ගණනකින් හෝ ඒ ක්‍රම සියල්ලම මගින්, එනම්, මහ නගර සභා ආඥා පනත යටතේ හෝ නගර සභා ආඥා පනත යටතේ හෝ ප්‍රාදේශීය සභා පනත යටතේ හෝ යම් බද්දක් පැනවීමෙන් හෝ එකී යම් බද්දක් කලින් බල පැවැත්වූ ප්‍රමාණයට වඩා වැඩි කිරීමෙන් හෝ ණයක් ලබා ගැනීමෙන්, මුදල් ලබා ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනයට විධාන කළ හැකිය. *බද්දක් අය කරන ලෙස හෝ ණයක් ලබාගන්නා ලෙස විධාන කිරීමට ඇති බලය.*

(2) (1) වන උප වගන්තියෙන් පැවරුණු බලතල ප්‍රකාර අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනයට ණයක් ලබාගන්නා ලෙස විධාන කරන අවස්ථාවක, ඒ යටතේ ලබාගන්නා ලද ණයකට අවස්ථාවෝචිතව ඒ විධිවිධාන අදාළ වන ආකාරයෙන් සහ ඒ ප්‍රමාණයට ම ඒ ණය සම්බන්ධයෙන් ද අදාළ විය යුතුය.

.....7.

(3) මහ නගර සභා ආඥා පනතින් හෝ නගර සභා ආඥා පනතින් හෝ ප්‍රාදේශීය සභා පනතින් හෝ ඒ යටතේ බලය ලැබ් ඇති උපරිම ප්‍රමාණයට වැඩි ප්‍රමාණයකින් යම් බද්දක් අය කිරීමට මේ වගන්තියේ ඉහත දැක්වූ විධිවිධාන කිසිවකින් පළාත් පාලන ආයතනයකට බලය ලැබෙන්නේ යයි සලකනු නොලැබිය යුතුය. නැතහොත් එසේ තේරුම් නොගත යුතුය.

08. මහ නගර සභා ආඥා පනතින් හෝ නගර සභා ආඥා පනතින් හෝ ප්‍රාදේශීය සභා පනතින් හෝ අමාත්‍යවරයා වෙත පිරි නැමුණු හෝ පැවරුනු බලතල හෝ කාර්ය කිසිවක් හීන කිරීම පිණිස නොව ඊට අතිරේකව විය යුතුය. අමාත්‍යවර අතිරේක

මේ ප්‍රඥප්තියේ

" සභාපතිවරයා " හෝ " උප සභාපතිවරයා "
යන්නෙන් —

යම් මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, නගරාධිපතිවරයා හෝ උප නගරාධිපතිවරයා වේ. යම් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් වූ විට සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වේ.

" පළාත් පාලන ආයතනය " යන්නෙන් —

(අ) එය මහ නගර සභා ආඥා පනත සම්බන්ධයෙන් වන විට මහ නගර සභාවද ;

(ආ) එය නගර සභා ආඥා පනත සම්බන්ධයෙන් වන විට නගර සභාවක් ද ;

(ඇ) එය ප්‍රාදේශීය සභා පනත සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභාවක් වේ.

(ඈ) අමාත්‍යවරයා යනු [illegible] පළාත් [illegible] විෂය භාර අමාත්‍යවරයා වේ.

ප/=